ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III/II ශ්‍රේණියේ තනතුරු සඳහා තෝරා පත් කර ගැනීමේ ලකුණු පරිපාටිය

01. ජ්‍යෙෂ්ඨතාවය **උපරිම ලකුණු 50**

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 අනුව ලකුණු ලබාදෙනු ලැබේ.

02. අධ්‍යාපන සුදුසුකම් **උපරිම ලකුණු 10**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි විශ්ව විද්‍යාලයකින්/ ආයතනයකින් ලබා ගත් සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

(ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම සඳහා ලකුණු හිමි වන පරිදි එක් සහතිකයකට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)

2.1	අධ්‍යාපන හා කළමනාකරණය සම්බන්ධ ශාස්ත්‍රපති උපාධිය හෝ ඊට ඉහළ සුදුසුකම් සඳහා	-	ලකුණු 10
2.2	මූලික උපාධිය	-	ලකුණු 07
2.3	අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා	-	ලකුණු 06
2.4	පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා	-	ලකුණු 04
2.5	පාසල් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව	-	ලකුණු 03

03. වාර්ෂික කාර්යය සාධන ඇගයුම් **උපරිම ලකුණු 15**

සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනට පෙර පූර්වාසන්න වසර 05 ක කාල පරිච්ඡේදයක් තුල වාර්ෂික කාර්ය සාධන ඇගයුමේ දී ලබා ගත් ඇගයුම් අනුව පහත දක්වා ඇති පරිදි ලකුණු ලබා දෙනු ඇත.

කාර්යසාධන ඇගයුමේ දී ලබා ගත් ඇගයුම්	වසරක් සඳහා ලබා දෙන උපරිම ලකුණු
විශිෂ්ඨ	ලකුණු 3
සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ	ලකුණු 2
සතුටුදායක	ලකුණු 1

සටහන:- කාර්යසාධනයේ ඉහත එක වරණයක් ඇත්නම් පමණක් ලකුණු ලබා දීම සිදුකරනු ලබන අතර වරණ කිහිපයක් ඇත්නම් හෝ කිසිදු වරණයක් සලකුණු කර නොමැතිනම් ලකුණක් ලබා දෙනු නොලැබේ.

04. ඉංග්‍රීසි භාෂා ප්‍රවීනතාවය

(සන්නිවේදන කුසලතාවය සලකා බලනු ලැබේ.) **උපරිම ලකුණු 02**

05. පරිගණක සාක්ෂරතාවය පිළිබඳ දැනුම **උපරිම ලකුණු 03**

තොරතුරු තාක්ෂණ පුහුණුව (රජය විසින් පිළිගත් ආයතනයකින් ලබා ගත්)

මාස 1 සිට 3 දක්වා පුහුණු සහතික පත්‍ර, ලකුණු - 02

මාස 3ට වැඩි, පුහුණු සහතික පත්‍ර ලකුණු - 03

06. සේවා ඇගයීම් **උපරිම ලකුණු 03**

අධ්‍යාපන ලේකම්, පළාත් අධ්‍යාපන ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පොදු 230 බී ප්‍රසංශා හා දෝෂ දර්ශන ආකෘතියට අනුව විධිමත් පරිදි නිකුත් කරන ලද සේවා ඇගයීම් සඳහා

සටහන : දෙපාර්තමේන්තු ප්‍රධානියා යනු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, විභාග කොමසාරිස් ජනරාල් හෝ අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් ය)

(එකකට ලකුණු 1 බැගින් උපරිම සේවා ඇගයීම් 3 ක් සඳහා)

07. අධ්‍යාපනයට අදාළ පර්යේෂණ සහ ප්‍රකාශන **උපරිම ලකුණු 05**

7.1 පර්යේෂණ - (එක් පර්යේෂණයකට ලකුණු 3 බැගින්) පර්යේෂණ පත්‍රිකාව ප්‍රසිද්ධ කර තිබිය යුතුය.

(පශ්චාත් උපාධියට/ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනයට අදාළ පර්යේෂණ/ නිබන්ධන සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ)

7.2 ප්‍රකාශන - (එක් ප්‍රකාශනයකට ලකුණු 02 බැගින්)

(පෙළපොත් හා ඒ ආශ්‍රිත ග්‍රන්ථ සඳහා ලකුණු ලබා දෙනු නොලබන අතර ග්‍රන්ථ ප්‍රකාශන මණ්ඩලය මගින් අනුමැතිය ලද ප්‍රකාශන පමණක් ලකුණු ලබාදීමේ දී සලකා බලනු ලැබේ.)

08. වර්යාත්මක නිපුණතා **උපරිම ලකුණු 10**

අයදුම්කරු විසින් දැනට සේවය කරනු ලබන සේවා ස්ථානයට අදාලව ආයතනයේ අරමුණු සාක්ෂාත් කිරීමට බලාපොරොත්තුවන සංවර්ධන වැඩපිළිවෙල ඉදිරිපත් කිරීමට දෘඩ පිටපතක් ඉදිරිපත් කල යුතු අතර, තම ප්‍රායෝගික අත්දැකීම් ද ඇසුරු කර ගනිමින් විනාඩි 05ක වාචික ඉදිරිපත් කිරීමක් Power point presentation ඇසුරෙන් සිදු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් කරුණු යටතේ ලකුණු ලබා දෙනු ලැබේ.

I.	කාල කළමණාකරණය	- ලකුණු 2 ½
II.	සන්නිවේදන කුසලතාවය	- ලකුණු 2 ½
III.	අන්තර්ගතය (අයතනයේ අරමුණු, යෝජනා)	- ලකුණු 2 ½
IV.	සමස්ථ ඉදිරිපත් කිරීම	- ලකුණු 2 ½

09. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය **උපරිම ලකුණු 02**

සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය/ පෞරුෂත්වය/ සන්නිවේදනය